# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: DFD/ GAMP/ 2019 - 01
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.01. 04


**චක්‍රලේඛ අංක: MFMM/ DFD/ 01/ 2019**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

***<u>ගම්පෙරළිය</u>* <u>- කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (RRDP) - 2019</u>**

2019.01.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, රටේ යටිතල පහසුකම් වල තත්වය වැඩිදියුණු කරන අතරම ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනයට හා ආර්ථික වර්ධනය වේගවත් කිරීමට ආධාරවීම සඳහා මෙම කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (RRDP) අඛණ්ඩව සිදු කිරීමට රජය මගින් තීරණය කර ඇත.

02. ඒ, අනුව 2018 දී ආරම්භ කරන ලද *ගම්පෙරළිය* යනුවෙන් හඳුන්වන කඩිනම් සංවර්ධන වැඩසටහන, පහත වගුවේ දක්වා ඇති ක්ෂේත්‍ර දොළහ යටතේ ක්‍රියාත්මක කරනු ඇත.

**ගම්පෙරළිය**

**වගුව: කඩිනම් සංවර්ධන වැඩසටහනෙහි විෂය පථය 2019**

| කාර්ය ක්ෂේත්‍රය | ඒකක සංඛ්‍යාව | උපරිම පිරිවැය සීමාව |
|---|---|---|
| 1. වැව් හා අමුණු | 1,400 | වැවක් සඳහා රු. මිලි. 4 |
| 2. මාර්ග අංශයේ යටිතල පහසුකම් | | |
| ග්‍රාමීය මාර්ග | 10,850 | ඒකකයක් සඳහා රු. මිලි. 2 |
| නාගරික අංශය- පටු වීදි | 1,500 | ඒකකයක් සඳහා රු. මිලි. 2 |
| 3. කුඩා පරිමාණ පාලම් ඉදිකිරීම | 150 | ඒකකයක් සඳහා රු. මිලි. 3 |
| 4. පාසල්වල සනීපාරක්ෂක පහසුකම් | | |
| නවීකරණයන් | 4,000 | පාසලක් සඳහා රු. 100,000 |
| නව ඉදිකිරීම් | 500 | පාසලක් සඳහා රු. මිලි. 1 |
| 5. ක්‍රීඩා ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | | |
| ක්‍රීඩා පිටි හා අදාල පහසුකම් වැඩිදියුණු කිරීම | 500 | ඒකකයක් සඳහා රු. මිලි. 2 |
| 6. වෙනත් සමාජ - ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය | | |
| නාගරික අංශයේ ජලාපවාහන වැඩිදියුණු කිරීම | 550 | ඒකකයක් සඳහා රු. මිලි. 1 |
| වගාවන් සඳහා කුඩා පරිමාණ ජල සැපයුම් යෝජනා ක්‍රම | 200 | ඒකකයක් සඳහා රු. මිලි. 1 |
| පානීය ජලය සඳහා කුඩා පරිමාණ ජල සැපයුම් යෝජනා ක්‍රම | 100 | ඒකකයක් සඳහා රු. මිලි. 1 |
| 7. 'සති පොළ' සංවර්ධනය | 200 | ඒකකයක් සඳහා රු. මිලි. 2 |
| 8. ළමා උද්‍යාන ඉදිකිරීම | 500 | ඒකකයක් සඳහා රු. මිලි. 3 |
| 9. විදුලි බලය නොමැති නිවාස සඳහා විදුලිය ලබාදීම | 100,000 | ඒකකයක් සඳහා රු. 30,000 |
| 10. පන්සල්/කෝවිල්/කතෝලික පල්ලි/මුස්ලිම් පල්ලි ප්‍රතිසංස්කරණය | 1,300 | ඒකකයක් සඳහා රු. මිලි. 1 |
| 11. ආගමික ස්ථාන සඳහා සූර්ය බල පහසුකම් ලබාදීම **(ඇමුණුම I බලන්න)** | 1,600 | ඒකකයක් සඳහා රු. 500,000 |
| 12. ග්‍රාමීය හා නාගරික මට්ටමින් නිවාස සංවර්ධනය- තාවකාලික වහල ස්ථිර වහල බවට පරිවර්තනය කිරීම ***(උපරිම පිරිවැය සීමාව තුල ප්‍රජා සහභාගිත්වය ඇතිව තාවකාලික නිවාස ස්ථිර නිවාස බවට පරිවර්තනය කිරීමට ද හැකියාව ඇත.)*** | 25,000 | ඒකකයක් සඳහා රු. 300,000 |

03. 2019 වසර සඳහා සෑම ඡන්ද කොට්ඨාශයකටම රු. මිලි. 300 වෙන්කරනු ඇත. කෙසේවුවද, 2019 වසරේ පළමු මාස 04 සඳහා අතුරු සම්මත ගිණුම මගින් සෑම ඡන්ද කොට්ඨාශයක් සඳහාම රු. මිලි. 200 ක් වෙන් කරනු ලබන අතර ඉතිරි රු. මිලි. 100ක මුදල 2019 අයවැය මගින් ලබාදෙනු ඇත. ඒ අනුව ව්‍යාපෘති තෝරා ගැනීම කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

04. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පහත දැක්වෙන මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කල යුතුය;

(අ) ගම්පෙරලිය වැඩසටහන දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණයෙන් යුතුව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ක්‍රියාත්මක කල යුතුය.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලැබෙන සියලුම ව්‍යාපෘති යෝජනා යොමුකිරීම සඳහා ඔබ යටතේ ක්‍රියාත්මකවන දිස්ත්‍රික් කමිටුවක් ස්ථාපනය කල යුතුය. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබීම තහවුරු කරමින් එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රමුඛ අවශ්‍යතා පිළිබිඹු කරන ව්‍යාපෘති හඳුනා ගත යුතුය.

(ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉහත වගුවේ දක්වා ඇති පුළුල් ක්ෂේත්‍රයන් මගින් දක්වා ඇති ව්‍යාපෘති තෝරා ගැනීමේදී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කල යුතුය; ප්‍රජාවගේ කැමැත්ත හා පිළිගැනීම; දිළිඳුබව තුරන් කිරීමට අවධානය යොමු කිරීම; නිෂ්පාදන හා ආදායම් වැඩි දියුණු කිරීම; ප්‍රදේශයේ ඇති සම්පත් ප්‍රශස්තව භාවිතය; ව්‍යාපෘතියේ තිරසාරත්වය; ප්‍රදේශයේ ප්‍රජා සහභාගිත්වය.

(ඈ) අදාල ව්‍යාපෘති ලැයිස්තුව දිස්ත්‍රික් ලේකම්වරු විසින් නිර්දේශ කළ පසු, එය අනුමැතිය සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පිහිටුවා ඇති "ගම්පෙරලිය ලේකම් කාර්යාලයට" ඉදිරිපත් කල යුතුය.

(ඉ) එක් එක් සංවර්ධන ක්ෂේත්‍රය යටතේ වන සම්පූර්ණ ව්‍යාපෘති ලයිස්තුව පිටු අංක 1 හි දක්වා ඇති සංඛ්‍යාව නොඉක්මවන බවට *ගම්පෙරලිය* ලේකම් කාර්යාලය මගින් තහවුරු කල යුතුය.

(ඊ) දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් 2019.08.31 දිනට පෙර ව්‍යාපෘති සම්පූර්ණ කිරීම තහවුරු කල යුතුය.

(උ) ඉහත වගුව පරිදි හඳුනාගනු ලැබූ සියලු ව්‍යාපෘති වල පිරිවැය, ඉන්ජිනේරු ඇස්තමේන්තුවකට අනුව සකස් විය යුතුය. කෙසේවුවද, අවසාන ඇස්තමේන්තුගත පිරිවැය ඉහත වගුවේ දක්වා ඇති 'උපරිම පිරිවැය සීමාව' නොඉක්මවිය යුතුය. එක් එක් ව්‍යාපෘති සඳහා පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීමේදී එක් එක් දිස්ත්‍රික් ලේකම් විසින් අදාල ප්‍රාදේශීය ලේකම් හා තාක්ෂණික මට්ටමේ නිළධාරින් සමඟ සම්බන්ධීකරණය කළ යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව හා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ සිටින කාර්මික නිළධාරින්ගේ සේවා ලබාගත යුතුය. අවශ්‍යවන්නේ නම් විශ්‍රාමික කාර්මික නිලධාරීන්ගේ/ ඉංජිනේරුවන්ගේ සේවය ලබාගත හැකිය.

(ඍ) සියලුම ගිවිසුම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව සිදුකල යුතුය. මේ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2018.07.09 දිනැති 34 වන අතිරේකය හා 2012.01.05 දිනැති අංක 01/2012 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

(එ) ව්‍යාපෘතිවල පරිපාලන වියදම් ආවරණය කරගැනීම සඳහා සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුවෙන් 3 % ක ප්‍රතිශතයක් නොඉක්මවන මුදලක් පරිපාලන වියදම් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ලබා ගත හැකිය. එම පරිපාලන වියදම් වලට ඉන්ධන, අතිකාල ගෙවීම්, වෙනත් දීමනා, ලිපි ද්‍රව්‍ය ආදිය ඇතුලත් විය යුතුය. කෙසේ වුවද, පරිපාලන වියදම්, අවසාන ව්‍යාපෘති පිරිවැය සඳහා වෙන්කර ඇති උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය.

(ඒ) වැඩසටහන් අධීක්ෂණය කිරීම හා ඇගයීම, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ගම්පෙරලිය ලේකම් කාර්යාලය මගින් සිදු කල යුතුය. දිස්ත්‍රික් ලේකම්වරුන් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් *ගම්පෙරලිය* ලේකම් කාර්ලයේ ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත ප්‍රගතිය සමාලෝචනය කිරීම හා වාර්තා කිරීම සඳහා, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පසුවිපරම් ක්‍රමවේදයක් ස්ථාපනය කල යුතුය.

(ඔ) දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවත්විය යුතු අතර ඊළඟ මාසයේ 10 වන දිනට පෙර ව්‍යාපෘතියේ ප්‍රගතිය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත වාර්තා කල යුතුය. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වාර්තාකරන ව්‍යාපෘතිවල කිසියම් අපගමනයක් සිදුවන්නේ නම් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සමඟ සාකච්ඡාකර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කල යුතුය.

(ඕ) ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ලබාදී ඇති නිර්නායකවලට අනුකූල වන පරිදි නාම පුවරුවක් (4′ × 2.5′ ප්‍රමාණයේ) සකස්කර යකඩ බට දෙකක් මගින් (GI පයිප්ප) සවිකල යුතුය. නාම පුවරුව සඳහා වන වියදම රු.6,000 නොඉක්මවිය යුතු අතර මෙය ව්‍යාපෘති පිරිවැයට ඇතුලත් විය යුතුය.

(ඖ) *ගම්පෙරලිය* වැඩසටහන සඳහා අයවැය ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය කිරීමේ, උතුරු පළාත් සංවර්ධනය, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධනය හා තරුණ කටයුතු අමාත්‍යාංශය හරහා දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබා දෙනු ඇත. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පදනම් කරගෙන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අත්මුදල් ඉල්ලා සිටිය යුතුය. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මුදල් නිදහස් කිරීම සඳහා පහසුකම් සැලසිය යුතුය.

(ක) දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡාකර *ගම්පෙරලිය* වැඩසටහනට අදාල සියලු වියදම් 2019.09.30 දිනට පෙර පියවීමට වග බලා ගත යුතුය.

(ග) සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යලයක්ම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සෑම පියවරකදීම අපේක්ෂිත ප්‍රතිඵල ලබා ඇති බවට තහවුරු කල යුතුය. අපගමනයක්/ ප්‍රමාදයක්/ අඩුපාඩු ආදිය ඇතිනම් ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත දැන්වීමට ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් කටයුතු කල යුතුය.

කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු කරුනු වහාම ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දැන්වීමට කටයුතු කරන්න.

**ආර්. එච්. එස්. සමරතුංග**
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය කිරීමේ, උතුරු පළාත් සංවර්ධනය, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධනය හා තරුණ කටයුතු අමාත්‍යාංශය
4. ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
5. ලේකම්, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
6. ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
7. ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
8. ලේකම්, විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය
9. සභාපති, ලංකා විදුලිබල මණ්ඩලය
10. සියලුම පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්
11. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව
12. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
13. විගණාධිපති
14. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
15. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
16. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
17. ව්‍යාපෘති අධ්‍යක්ෂ, *ගම්පෙරලිය* වැඩසටහන

# ආගමික ස්ථාන සඳහා සූර්ය බලශක්ති පහසුකම් ලබාදීම

මෙහිදී පහත පියවර අනුගමනය කළ යුතුය

(i) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර සුදුසු සූර්ය බලශක්ති සැපයුම්කරුවෙකු තෝරාගත යුතුය.

(ii) මෙම සැපයුම්කරුවන් සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචිවී තිබිය යුතුය.

(iii)අමතර බලශක්තිය, ජාතික විදුලිබල පද්ධතියට ලබාදීම සඳහා සැපයුම්කරු විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

(iv)සැපයුම්කරු විසින් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා පහත දැක්වෙන පරිදි අවම වගකීම් කාලයක් ලබාදිය යුතුය.

(අ) සූර්ය පැනල (Solar Panel) - අවුරුදු 25

(ආ) අපවර්තකය (Inverter) - අවුරුදු 10

(v) දේපළ හිමිකරු, ලංකා විදුලිබල මණ්ඩලය (CEB) / ලංකා විදුලිබල සමාගම (LECO) සමඟ ගිවිසුමක් අත්සන් කළයුතු අතර එම ගිවිසුම සූර්ය බලශක්ති සැපයුම්කරු විසින් පිළියෙල කළ යුතුය.